**මුල් (බැංකු) පිටපත**

**මුදල් යැවීමේ අයදුම්පත**

කරුණාකර පහත දෑ සිදුකරන්න/නිකුත් කරන්න.   ඉල්ලුම් අණකරය/අයකැමි නියෝගය ස්ලිප්ස් ගිණුම් මාරුකිරීම.

(කරුණාකර මෙම අයදුම්පත කළු පැනක් භාවිතා කර ලොකු අකුරින් ලියා හෝ යතුරුලියන කර ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කරන්න)

| | | |
|---|---|---|
| ශාඛාවේ නම | දිනය | උපදෙස් සඳහා පසුපිට බලන්න |
| මුදල් යවන්නාගේ හර කිරීමේ ගිණුම | | හර මුදල් වර්ගය |
| ගාස්තු ගිණුම් අංකය | ගාස්තු මුදල් යවන්නාගේ ගිණුමට. අනෙක් සියළු ගාස්තු අර්ථලාභියාගේ ගිණුමට | සියළුම ගාස්තු මුදල් යවන්නාගේ ගිණුමට |

**මුදල් යවන්නාගේ තොරතුරු (යවන්නා)**

| | |
|---|---|
| නම<br>ලිපිනය<br>හැඳුණුම්පත් අංකය/ගමන් බලපත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය | දුරකථන අංකය<br>ජංගම දුරකථන අංකය<br>ෆැක්ස් අංකය |

**ගෙවීම් තොරතුරු**

| | | |
|---|---|---|
| යවන මුදල් වර්ගය<br>*<u>හෝ ඊට සමානව</u>*<br>යවනමුදල් වර්ගය | මුදල<br><br>මුදල | කරුණාකර යැවිය යුතු මුදල් ප්‍රමාණය හෝ පවතින විනිමය අනුපාතය යටතේ එය පරිවර්තනය කළ යුතු ඊට සමාන මුදල් වර්ගය සඳහන් කරන්න |
| මුදල් වර්ගය සහ මුදල (අකුරින්) | | |

**අර්ථලාභියාගේ තොරතුරු (ලබන්නා)**

| |
|---|
| අර්ථලාභියාගේ ගිණුම් අංකය<br>අර්ථලාභියාගේ බැංකුවේ නම<br>අර්ථලාභියාගේ බැංකුවේ ලිපිනය<br>මුදල් යවන රට<br>අර්ථලාභියාගේ සම්පූර්ණ නම<br>අර්ථලාභියාගේ ලිපිනය |

| |
|---|
| <u>අණකරය/ අයකැම් නියෝගය භාරදීම</u><br>මා විසින් බැංකුවෙන් ලබාගන්නා තුරු ලියවිල්ල තබාගන්න<br>මාගේ ලිපිනයට තැපෑලෙන් එවන්න<br>අර්ථලාභියාගේ ලිපිනයට තැපෑලෙන් එවන්න<br>ලබාගන්නාගේ නම හැඳුනුම්පත් අංකය |

| |
|---|
| ගෙවීමේ අරමුණ පිළිබඳ ප්‍රකාශනය<br>ඉහත දක්වා ඇති මුදල් පහත දක්වා ඇති නීත්‍යානුකූල අරමුණ සඳහා යැවීමට මම/අපි බැංකුවට අවසර දෙන අතර, ඇමුණුම් අංක 1 හි දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි වලින් බැඳී සිටීමට එකඟ වෙමි/මු.<br>මුදල් යැවීමේ අරමුණ දක්වන්න- |

| | |
|---|---|
| මූලික ගිණුම් හිමියාගේ අත්සන | ද්විතීයික ගිණුම් හිමියාගේ අත්සන |

| | | |
|---|---|---|
| **බැංකුවේ භාවිය සඳහා පමණි**<br>-අත්සන තහවුරු කරගන්නා ලදී<br>-ෆැක්ස් හානිපූරණය ලබාගැණුනි<br>(ෆැක්ස් මගින් ලබාගැනීම සඳහා පමණි)<br>-එස්ආර්එල්/ඒඑම්එල් සම්පූර්ණ කරනලදී<br>-ආපසු ඇමතීම කරන ලදී | ගණුදෙනු යොමු අංකය | ඇතුලත් කළේ |

<u>**ඇමුණුම් අංක 1**</u>

**මුදල් මාරුකිරීම්, ස්ලිප්ස්, ඉල්ලුම් අණකර හා අයකැම් නියෝග පාලනය වන නීතිරීති සහ කොන්දේසි**

**1. ගාස්තු සහ කොමිස් මුදල්**

(අ) ප්‍රකාශයට පත්කර ඇති අනුපාත හා අයකිරීම් මගපෙන්වුමට අනුකූලව, බැංකුව විසින් මුදල් යැවීමේ අයදුම්පත ක්‍රියාවේ යෙදවීම/ඉල්ලුම් අණකරය නිකුත් කිරීම සඳහා වන ගාස්තු හා කොමිස් මුදල් ගණුදෙනුකරුගේ ගිණුමෙන් හර කරනු ඇත. බැංකුවේ අභිමතය පරිදි ගාස්තු කලින් කලට සංශෝධනය කෙරෙනු ඇත.

(ආ) විශේෂිතව දක්වා නොමැති නම් ශ්‍රී ලංකාවෙන් පිටත සියලු අයකිරීම්/කොමස් මුදල් අර්ථලාභියාගේ ගිණුමෙන් අයකෙරේ.

(ඇ) අනුයෝජිත බැංකු කොමිස් මුදල්, ගාස්තු හෝ වෙනත් අයකිරීම් - අනුයෝජිත බැංකුව විසින් අර්ථලාභියාගේ ගිණුමට මුදල් ගෙවීමේදී කොමිස් මුදල්, ගාස්තු හෝ වෙනත් අයකිරීම් කළ හැක. අනුයෝජිත බැංකුව විසින් එකී කොමිස් මුදල්, ගාස්තු හෝ අයකිරීම් අර්ථලාභියාගේ ගිණුමට ගෙවන අරමුදල් වලින් අඩුකරගැනීම හෝ ඒවා ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව මත පැවරීමට ද හැකිය. අඩුකිරීමක් සිදුකළ විටෙක, අර්ථලාභියාට ලැබෙනු ඇත්තේ ඔබගේ උපදෙස් වල සඳහන් වන ගෙවීම් මුදලට වඩා අඩු මුදලකි. කොමිස් මුදල්, ගාස්තු හෝ වෙනත් අයකිරීම් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව

වෙත පවරා ඇති විට ඒවා ඔබ විසින් ආපසු ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත ගෙවිය යුතු වනු ඇත.

(ඈ) බැංකුව විසින් එහි අභිමතය පරිදි ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම නිසා සිදු නොකරන ලද සෑම ගෙවීමක් සඳහා ම ගාස්තුවක් අය කරනු ඇත.

**2. විදේශ මුදල් මාරුකිරීම් හා අනුපාතයන්**

(අ) හරස් මුදල් පරිවර්තන අවශ්‍ය කෙරෙන ගණුදෙනු සඳහා ගණුදෙනුව ක්‍රියාවේ යොදවන විට අදල මුදල් වර්ගය මිලදීගැනීමට හා විකිණීමට පවතින අනුපාතයට හෝ ලෝක වෙළඳපොල තරව්කරුවන් අතර එකඟවන අනුපාතයකට එම මුදල් වර්ගය පරිවර්තනය කරනු ඇත.

**3. පෞද්ගලිකත්වය**

ඔබගේ ගනුදෙනුව ක්‍රියාවේ යෙදවීමට සහ ශ්‍රී ලංකාවේ අදල වන සියලුම නීති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් පෞද්ගලික තොරතුරු එක්රැස් කරනු ඇත. බැංකුව විසින් එම තොරතුරු අර්ථලාභියාගේ බැංකුවට, අනුයෝජිත බැංකුවකට හෝ වෙනත් අදල රජයේ හෝ නියාමන අධිකායකට හෙළිදරව් කරනු ඇත.

**4. අධිකරණ බලය**

(අ) මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වනු ඇති අතර, ඉන් පැනනගින යම් අයැදීමක් විමසීමට ශ්‍රී ලංකාවේ අධිකරණ වලට අනන්‍ය නොවන අධිකරණ බලය පවතිනු ඇත.

(ආ) ගෙවීම කරන රටෙහි නීතියට අනුව නීත්‍යානුකූල නොවන අවස්ථාවල හැර, ඉල්ලුම් අණකරය නිකුත්කළ රටෙහි නීති වලින් පාලනය වනු ඇත.

**5. විනිමය පාලන/ වෙනත් සීමාකිරීම්**

මාරුකිරීම මුදල් බවට හැරවීම එම මුදල් බවට හරවන රටේ නීතිරීති හා රෙගුලාසි මගින් පනවා ඇති යම් විනිමය පාලන හෝ වෙනත් සීමාකිරීම් වලට යටත් වනු ඇත. එවැනි නීතිරීති සහ රෙගුලාසි මගින් සිදුවන යම් පාඩුවක් හෝ ප්‍රමාදයක් සඳහා බැංකුව හෝ එහි අනුයෝජිතයන් හෝ නියෝජිතයන් වග නොකියනු ඇත.

**6. මුදල් විශුද්ධිකරණ විරෝධී/ නීතිවිරෝධී ගණුදෙනු**

කිසියම් තැනැත්තෙකු විසින් යම් රටක නීතියක් හෝ රෙගුලාසියක් කඩකිරීමකට සම්බන්ධ යැයි බැංකුව විශ්වාස කරන ගෙවීමක් සිදුකිරීමට බැංකුව ප්‍රතික්ෂේප කළ හැකිය. මුදල් ගෙවීමට සම්බන්ධ යම් පුද්ගලයෙකු නිසා හෝ නීතිය හෝ රෙගුලාසි වලට අනුකූලතාවය පිළිබඳව තොරතුරු හෝ පැහැදිළි කිරීමක් බලාධිකාරියක් විසින් ඉල්ලා සිටියි නම්, හෝ එය ක්‍රියාවේ යෙදවීම ප්‍රතික්ෂේප කරයි නම්, ගෙවීමක් ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය. බැංකුව විසින් අවශ්‍ය පරිදි ඔබගේ මුදල් යැවීම පිළිබඳ තොරතුරු හුවමාරු කරගනු ඇත.

## 7. වැඩකරන දින

බැංකුව විසින් කලින් කලට සිය ලැබුම් ශාඛාවන් හෝ මධ්‍යස්ථාන මගින් දැනුම් දී ඇති නියමිත කාලසීමාවන්ට (cut-off) පෙර බැංකුව වෙත ලැබෙන අයදුම්පත් ක්‍රියාවේ යෙදවීමට සාධාරණ උත්සාහයක් දරණු ඇත. එකී නියමිත කාලසීමාවන්ට පසුව ලැබෙන අයදුම්පත් ඊළඟ වැඩකරන දිනයේදී ක්‍රියාවේ යෙදවෙනු ඇත. මෙම අරමුණ සඳහා සියළු බැංකු නිවාඩු දින හා සති අන්ත වැඩ නොකරන දින අදාල නොවේ. ගෙවීමේ දිනය බැංකු නිවාඩු දිනයක් වන විට බැංකුව විසින් ඊළඟ වැඩකරන දිනයේදී ගෙවීම සිදුකරනු ඇත.

## 8. විමසීම්, ගෙවීම් නැවතීම සහ අවලංගු කිරීම

සමහර සීමිත තත්ත්වයන් යටතේ උපරිම උත්සාහ පදනමින් බැංකුව විසින් ගෙවීමක් නැවතීමට හෝ අවලංගු කිරීමට උත්සාහ දරණු ඇත. අර්ථලාභියාගේ බැංකුව වෙත අරමුදල් ලැබුණු පසුව, අයදුම්කරු විසින් යැවූ මුදල නැවත බැංකුවෙන් ලබාගැනීමට කැමති නම්, බැංකුව විසින් සිය අභිමතය පරිදි, සියළු ගාස්තු හා වියදම් අඩුකර අදල මුදල් වර්ගයේ පවතින ගැණුම් අනුපාතයට අයදුම්කරු වෙත ගෙවනු ඇත. සියලු විමසීම්, ගෙවීම් නතරකිරීම් හා අවලංගුකිරීමේ ඉල්ලීම් සඳහා ගාස්තු, ප්‍රකාශයට පත්කර ඇති අනුපාත හා ගාස්තු මගපෙන්වුමට අනුව ගණුදෙනුකරුගේ ගිණුමෙන් හර කෙරේ.

## 9. නැතිවූ හෝ සොරකම් කළ ඉල්ලුම් අණකර/අයකැමි නියෝග

ඉල්ලුම් අණකරයක්/අයකැමි නියෝගයක් නැතිවී හෝ සොරකම් කර ඇත්නම්, බැංකුවට පිළිගත හැකි හානිපූරණයක් බැංකුව වෙත සැපයීමට ගනුදෙනුකරු එකඟ වෙයි. අණකර/අයකැමි නියෝග සෘජුවම අර්ථලාභියා වෙත යැවෙන විට, ටෙලිග්‍රාෆ් හෝ තැපැල් අධිකාරීන් අතින් සිදුවන යම් ප්‍රමාදයක්, අත්වැරදීමක් හෝ නොකර හැරීමක් සඳහා බැංකුව හෝ එහි ශාඛාවන් හෝ අනුයෝජිතයන් වගකිවයුතු නොවන අතර, අණකරය/අයකැමි නියෝගය නැතිවූ හෝ සොරකම් කළ අවස්ථාවක මුදල් ආපසු ගෙවීමට බැංකුව බැඳී නොමැත.

## 10. ගෙවීමේ ප්‍රමුඛතාවය

ගෙවන දිනයේදී, ඉදිරිපත් කෙරෙන චෙක්පත් හා වෙනත් ගෙවීම් උපදෙස් සහ බැංකුව සමඟ එළඹ පවතින වෙනත් යම් සූදනම්කිරීම් සමඟ මෙම ගෙවීමේ නියෝගයේ ප්‍රමුඛතාවය තීරණය කිරීමට ද, සිය තනි අභිමතය මත අනෙක් තරඟකාරී ගෙවීම් වල ප්‍රමුඛතාවය තීරණය කිරීමෙන් පසු මෙහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම අයිරා වන්නේ නම් හෝ, අයිරා පහසුකමක් ලබා දී ඇත්නම් එම අයිරා සීමාව ඉක්මවා යන්නේ නම්, මෙම ගෙවුම් නියෝගය යටතේ ගෙවීම් නොකිරීමට ද බැංකුව අයිතිය රඳවාගනියි.

## 11. ගිවිසුම හා අවසරදීම

මුදල් යැවීමේ අයදුම්පත අත්සන් කිරීම මගින් ඔබ පහත දෑ පිළිගෙන එකඟ වී සිටියි. (අ) ඔබ නීතිරීති සහ කොන්දේසි කියවා තේරුම්ගෙන සිටින බව සහ ඒවා මගින් බැඳී සිටීමට එකඟ වන බව (ආ) මෙම අයදුම්පත සම්බන්ධයෙන් ඔබ විසින් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත සපයා ඇති සියලු

තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට ඔබ සහතික කර තහවුරු කරන බව (ඇ) මෙම කොන්දේසි වල දක්වා ඇති සමස්ත ගෙවීම, කොමිස් මුදල් (ඇත්නම්), වෙනත් ගාස්තු, පිරිවැය හා බදු මෙම ලේඛණයේ 'ගෙවීම් ආකෘතිපත්‍රය' හෝ 'ගාස්තු ආකෘතිපත්‍රය' යන අංශවල දක්වා ඇති ඔබේ ගිණුමෙන් හර කිරීමට ඔබ විසින් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට අවසර දෙන බව (ඈ) සමහර තත්ත්වයන් යටතේ, මුදල් යැවීමේ ඉල්ලීම බැංකුව විසින් ක්‍රියාවේ යෙදවීමට පෙර, වැඩිදුර අතිරේක ලිඛිත ප්‍රශ්න වලට පිළිතුරු දීමට ඔබට නියම කළ හැකි බව.